# මුනි සිරිපා සිඹිමින්නේ

**සටහන**

"මුනි සිරිපා සිඹිමින්නේ" පද්‍ය පන්තියේ හඳුනා ගත හැකි සුවිශේෂ ලක්ෂණ

1. පද්‍ය පන්තිය පුරාම යොන් මත් වැල නම් වූ සිව්පද විරිතෙන් කවි නිර්මාණය වීම.

   මෙහිදී පද්‍ය පාදයකට ඇත්තේ මාත්‍රා 12කි. පාද මධ්‍යයේ දී විරාමය පිහිටයි.

2. පද්‍ය පන්තිය අවසානයේ එළිසමය ආරක්ෂා වීම.

   පද්‍යයක් අවසානයේ එක ම අකුරකින් හෝ එක ම වචනයකින් අවසන් වීම.

3. පද්‍ය පන්තිය පුරාවට ම අලංකාර රූපක භාවිතය.

4. අනුප්‍රාස භාවිතය.

   එක ම අකුරක් හෝ වචනය එක් අවස්ථාවකට වඩා කවි තුළ යොදා ගැනීම.

5. සරල බස් වහර.

6. උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයෙන් රචනා වීම.

7. සංයමය.

**පැවරුම**

1. "මුනි සිරිපා සිඹිමින්නේ" පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න.

2. මෙම පද්‍ය පන්තිය රචනා කිරීමේ මූලික අරමුණු මොනවාද?

3. එස්. මහින්ද හිමියන් විසින් රචනා කළ මුල් ම කාව්‍ය කෘතිය කුමක්ද?

4. එස්. මහින්ද හිමි අයත් වන කවි පරපුර කුමක්ද?

5. පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

   මිතුරු කමින් පෙරට        එතොත්

   දූවිල්ලක් එක්ක              වුණත්

   ................................................

   ................................................